සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2025-01

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

Kandana
51382

වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)
ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)
Year End Evaluation - 2024 (2025)

| ශ්‍රේණිය / தரம் / Grade | 08 | විෂයය / பாடம் / Subject | භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 02 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ............................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ....................

## I කොටස

සැලකිය යුතුයි
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

---

- ප්‍රශ්න අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. වාමන ග්‍රහයෙක් වන්නේ මින් කුමක් ද?
(1) අඟහරු (2) බුධ (3) බ්‍රහස්පති (4) ප්ලූටෝ

02. වායුගෝලයේ ඇති වායු සංයුතියෙන් වැඩි ම ප්‍රතිශතයක් හිමිකර ගන්නා වායුව කුමක් ද?
(1) ඔක්සිජන් (2) නයිට්‍රජන් (3) කාබන්ඩයොක්සයිඩ් (4) ඕසෝන්

03. දකුණු ආසියානු කලාපීය රටකි,
(1) කාම්බෝජය (2) වියට්නාමය (3) භූතානය (4) ජපානය

04. සින්දු ගඟ පිහිටා ඇත්තේ කුමන රටේ ද?
(1) පාකිස්ථානය (2) ඉන්දියාව (3) බංග්ලාදේශය (4) නේපාලය

05. 1:50 000 භූ ලක්ෂණ සිතියමක සිතියම් පත්‍ර අංක 54න් දැක්වෙන්නේ කුමන සිතියම් පත්‍රය ද?
(1) කෑගල්ල (2) ගම්පොළ (3) මාතලේ (4) මහනුවර

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවල දැක්වෙන ප්‍රකාශන නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන් තුළ යොදන්න.

06. පෘථිවි වායුගෝලයේ අඩු ම වායු ප්‍රතිශතයක් හිමි කරගන්නේ ඔක්සිජන් වායුවයි. ( )

07. විශ්වය නිරීක්ෂණයට දුරදක්නය මුලින් ම භාවිත කරන ලද්දේ ගැලීලියෝ ගැලලි විසිනි. ( )

08. සෞරග්‍රහ මණ්ඩලයේ වැඩි ම උප ග්‍රහයින් සංඛ්‍යාවක් ඇත්තේ යුරේනස් ග්‍රහයාට යි. ( )

09. ඇෆ්ගනිස්ථානය භූගෝලීය වශයෙන් අයත් වන්නේ මධ්‍යම ආසියාවට ය. ( )

10. මුම්බායි නගරය බොලිවුඩ් නමින් ලොව ප්‍රචලිත ය. ( )

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල හිස්තැන්වලට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න. (සිකුරු, අඟහරු, දෙසැම්බර් 22, මාර්තු 21, යුරේනස්)

11. ෆොබෝස් හා ඩයිමෝස් ලෙස නම් කර ඇති උප ග්‍රහයන් දෙදෙනෙක් .................................. ග්‍රහයාට ඇත.

12. පහන් තරුව ලෙස ...................................... ග්‍රහයා හඳුන්වයි.

13. උතුරු අර්ධ ගෝලයේ දී සිසිර නිවෘත්තිය සිදුවන්නේ ........................................ වැනිදා ය.

14. උතුරු අර්ධ ගෝලයේ දී වසන්ත විෂුවය ලෙස හඳුන්වන සමකයට හිරු මුදුන්වීම ............................................. සිදුවේ.

15. සෞරග්‍රහ මණ්ඩලයේ තෙවන විශාලතම ග්‍රහලෝකය ......................................... වේ.

- ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් "අ" තීරුවේ දැක්වෙන රට "ආ" තීරුවේ දැක්වෙන පිළිතුර සමඟ නිවැරදි ව ගලපන්න.

| | අ | ආ |
|---|---|---|
| 16. | ඉන්දියාව | හින්දුකුෂ් |
| 17. | පකිස්ථානය | බටහිර ඝාට්ස් |
| 18. | නේපාලය | ඩකා |
| 19. | භූතානය | තිම්පු |
| 20. | බංග්ලාදේශය | කත්මන්ඩු |

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නය අනිවාර්යය වේ.

01. පහත රූප සටහනේ දැක්වෙන අක්ෂර වල පිහිටීම නිවැරදි අනුපිළිවෙළට පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

(i) A - ..........................................................

(ii) B - ..........................................................

(iii) C - ..........................................................

(iv) D - ..........................................................

(v) E - ..........................................................

(vi) F - ..........................................................

(vii) G - ..........................................................

(viii) H - ..........................................................




(ලකුණු 2×8)

02. (i) බාහිර ග්‍රහලෝක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) සෞරග්‍රහ මණ්ඩලය පිළිබඳ බැඳී පවතින විශ්වාස හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) (අ) සූර්යයාගේ විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 02)

(ආ) 'තාරකා' යනු කුමක් දැයි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(i) පෘථිවියේ භ්‍රමණය නිසා ඇතිවන සංසිද්ධි දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) පෘථිවියේ භ්‍රමණය සහ පරිභ්‍රමණය යනු කුමක් දැයි හඳුන්වන්න. (ලකුණු 04)

(iii) (අ) පෘථිවියේ ප්‍රධාන ඍතු හතරකි. ඉන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ආ) ඉහත ඔබ සඳහන් කළ ඍතු අතරින් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

04. (i) වායුගෝලයේ වායු වර්ග හැරුණු විට පවතින වෙනත් දේවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) වායුගෝලයේ වැදගත්කම පිළිබඳ කරුණු හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) (අ) ජලය දූෂණයට ලක්වන හේතු දෙකක් ලියන්න. (ලකුණු 02)

(ආ) ජල දූෂණය අවමකර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග දෙකක් කෙටියෙන් ලියන්න. (ලකුණු 03)

05. (i) සාර්ක් සංවිධානයට අයත් රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) හිමාලය කඳුකරයේ වාසය කරන ජනවර්ග දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) (අ) හිමාලය කඳුකරයේ ජීවත්වන ජනතාවගේ රැකියා දෙකක් ලියන්න. (ලකුණු 02)

(ආ) හිමාලය කඳුකරයේ ජනතාවගේ නිවාස හා කෘෂිකර්මය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

06. (i) ධීවර කර්මාන්තය ආශ්‍රිත මානුෂ ක්‍රියාකාරකම් දෙකක් ලියන්න. (ලකුණු 02)

(ii) ගංගා නම් නදියේ පහළට ගමන් කරන විට දක්නට ලැබෙන භූරූප හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) (අ) ගංගා නදියේ පහළ ඩෙල්ටා ප්‍රදේශයේ දක්නට ලැබෙන ප්‍රධාන වගාව කුමක් ද? (ලකුණු 01)

(ආ) මෙම නිම්නය තුළ කෘෂිකර්මාන්තය සිදුකරන ආකාරය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

07. (i) භූ ලක්ෂණ සිතියමක දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ දෙක කුමක් ද? (ලකුණු 02)

(ii) සමෝච්ච රේඛාවල ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 0[illegible])

(iii) (අ) භූ ලක්ෂණ සිතියමක දක්නට ලැබෙන භූ විෂමතා ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ආ) ඉහත (අ) යන්නෙහි සඳහන් කළ භූ විෂමතා ලක්ෂණ සමෝච්ච රේඛා ඇසුරින් රූප සටහන් භාවිත කර කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)